0690

OL/2021(2022)/82/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

82 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය I, II
நீருயிரினவளத் தொழினுட்பவியல் I, II
Aquatic Bioresources Technology I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ශ්‍රී ලංකාවේ වැඩි ම කලපු සංඛ්‍යාවක් පිහිටා ඇත්තේ,
(1) උතුරු පළාතේ ය. (2) බස්නාහිර පළාතේ ය. (3) දකුණු පළාතේ ය. (4) වයඹ පළාතේ ය.

2. මුහුදු තෘණ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – නොගැඹුරු කරදියේ නිමග්නව වැඩේ.
B – ඒකබීජපත්‍රික සපුෂ්පී ශාක වේ.
C – මුහුදෙන් මතු වූ ගල්පරවල සරුවට වැඩේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

3. රූපයේ දැක්වෙන ශාකයේ A ලෙස නම් කර ඇති කොටස වඩාත් වැදගත් වන්නේ,
(1) දැව ඉන්ධනයක් ලෙස ය.
(2) රසවත් බීම සැකසීමට ය.
(3) වෙරළ සංරක්ෂණයට ය.
(4) වඩදිය බාදිය පාලනයට ය.



4. ජෛව විවිධත්වයෙන් පොහොසත් බොනවිස්ටා පරය,
(1) කොරල් පරයකි. (2) ගල් පරයකි. (3) වැලි පරයකි. (4) වැලිගල් පරයකි.

5. සාමුද්‍රිකව වාසය කරන කාටිලේජීය මත්ස්‍යයකු වන්නේ,
(1) තෝරා ය. (2) මඩුවා ය. (3) තලපතා ය. (4) කොප්පරා ය.

6. ආහාර දාම සලකා බැලීමේ දී ජීවයේ පැවැත්මට වැඩි ම දායකත්වයක් දක්වන පෝෂණ මට්ටමට අයත් වන්නේ,
(1) ශාක ප්ලවාංග ය. (2) සත්ත්ව ප්ලවාංග ය. (3) කුඩා මසුන් ය. (4) විශාල මසුන් ය.

7. කඩොලාන පරිසර පද්ධතිවල ලවණතාව පාලනය කිරීමට වඩාත් වැදගත් වන්නේ මින් කුමක් ද?
(1) දියවැල් (2) උදම් (3) උත්ක්‍රපායනය (4) ගංවතුර

8. කඳුකර ප්‍රදේශයන්හි පිහිටි ජලාශවල ප්‍රාථමික නිෂ්පාදනය අඩු වීමට බලපාන ප්‍රධාන ක්‍රියාවලිය වන්නේ,
(1) සුළි සුළං ය. (2) ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම ය.
(3) පාංශු ඛාදනය ය. (4) උත්ක්‍රපායනය ය.

[දෙවැනි පිටුව බලන්න.

9. ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය (EEZ) නිවැරදිව දැක්වෙන රූපය තෝරන්න.



(1) (2) (3) (4)

10. නිවසට ගෙනා මත්ස්‍යයකු නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙක් එම මත්ස්‍යයා ජල ස්තරය මතුපිට වෙසෙන්නකු බව පවසන ලදී. මෙම නිගමනයට එළඹීම සඳහා ඔහු විසින් නිරීක්ෂණය කරන ලද මත්ස්‍යයාගේ ශරීර කොටස වන්නේ,

(1) කරමල් පෙරු ය. (2) මුඛය ය. (3) ඇස් ය. (4) අංශ රේඛාව ය.

11. ජලයෙන් පිටත වැඩි ම කාලයක් ජීවය පවත්වාගත හැකි මත්ස්‍ය විශේෂය මින් කුමක් ද?

(1) හාල්මැස්සා (2) හුරුල්ලා (3) බලයා (4) කාවයියා

12. සමනල් මාළු (Butterfly fish) හා විගඩම් මාළු (Clown fish) යන විසිතුරු මසුන් වාසය කරන පරිසර පද්ධතිය කුමක් ද?

(1) කඩොලාන (2) කොරල්පර (3) ගංගාශ්‍රිත (4) මිරිදිය ජලාශ

13. එක්තරා ජලාශයක සිටි මත්ස්‍යයින් සියල්ල එකවර මැරී සිටිනු නිරීක්ෂණය වූ අතර ජලාශයේ ජලයේ වර්ණ වෙනසක් දක්නට නොලැබුණි. මෙලෙස මත්ස්‍යයින් මිය යෑමට ප්‍රධාන හේතුව විය හැක්කේ,

(1) කාබනික පොහොර එකතු වී සුපෝෂණය වීමයි.
(2) ජලයට විෂ රසායනික ද්‍රව්‍යයක් එක් වීමයි.
(3) ජලයේ ආවිලතාව වැඩි වීමයි.
(4) ශාක ගහනය අඩු වී ජලයේ ඔක්සිජන් (O_2) සාන්ද්‍රණය අඩු වීමයි.

14. හෝර්මෝන කිහිපයක නම් පහත A සිට D දක්වා සඳහන් කර ඇත.

A – ප්‍රොස්ටග්ලැන්ඩින් (PG)
B – වර්ධක හෝර්මෝනය (GnRH)
C – ඔක්සිටොසින් (OXT)
D – ලුටෙනිකාරක හෝර්මෝනය (LHRH)

ඉහත හෝර්මෝන අතුරෙන් ආහාරමය මිරිදිය මත්ස්‍යයින් කෘත්‍රිමව අභිජනනය කිරීමට භාවිත කෙරෙනුයේ,

(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි.
(3) B, C හා D පමණි. (4) A, B, C හා D සියල්ල ම ය.

15. මෙම රූපසටහනේ දැක්වෙන ජීවන චක්‍රය නිරූපණය කරන විසිතුරු මත්ස්‍යයකු වන්නේ,

(1) ගෝල්ඩ් ෆිෂ් ය.
(2) ඒන්ජල් ය.
(3) ස්වෝඩ්ටේල් ය.
(4) ෆයිටර් ය.



16. අඩු පිරිවැයකින් පහසුවෙන් ම ඇති කළ හැකි විසිතුරු මත්ස්‍ය විශේෂය මින් කුමක් ද?

(1) බුලත් හපයා (2) ගෝල්ඩ් ෆිෂ් (3) ඩිස්කස් (4) ප්ලේටි

17. ආහාර පිණිස නිවසට ගෙනා මුහුදු ජීවී විශේෂයක් තුළ කළු පැහැති තීන්ත වැනි ද්‍රව්‍යයක් දක්නට ලැබුණි. මෙම සත්ත්ව විශේෂය වන්නේ,

(1) මුහුදු ඉකිරියා ය. (2) දැල්ලා ය. (3) ඉස්සා ය. (4) කකුළුවා ය.

18. රූපයේ දැක්වෙන ආහාරමය ජලජ ශාකය කුමක් ද?

(1) ඔලු
(2) කොහිල
(3) ලුණුවිල
(4) කෙකටිය

19. කරදියෙහි පමණක් දක්නට ලැබෙන ජලජ ජීවියකු වන්නේ,
(1) කකුළුවා ය. (2) බෙල්ලා ය. (3) ඉස්සා ය. (4) පතා මැඩියා ය.

20. පුෂ්ප වෘන්ත මගින් ප්‍රචාරණය වන ජලජ ශාකයක් වන්නේ,
(1) ඇමේසන් ස්වෝඩ් ය. (2) නෙළුම් ය.
(3) ඇරෝහෙඩ් ය. (4) කුමුදු ය.

21. මත්ස්‍ය ආහාර සැකසීමේ දී යොදා ගනු ලබන ශාක ප්‍රෝටීන ප්‍රභවයක් වන්නේ මින් කුමක් ද?
(1) කිරිගු පිටි (2) හාල් නිවුඩු (3) මුහුදු පැළෑටි (4) සෝයා බෝංචි අන්නය

22. අධික ප්‍රෝටීන ප්‍රමාණයක් සහිත ආහාර අවශ්‍ය වන්නේ,
(1) කුඩා මත්ස්‍ය පැටවුන්ට ය. (2) තරමක් වර්ධනය වූ මත්ස්‍යයින්ට ය.
(3) අස්වනු නෙළන අවධියේ මත්ස්‍යයින්ට ය. (4) රෝගී මත්ස්‍යයින්ට ය.

23. බහුදින යාත්‍රාවල ලෝක ව්‍යාප්ත ස්ථානීය සංඥා පද්ධතිය (GPS) මගින් ලබාගත හැකි තොරතුරක් වන්නේ,
(1) ජලයේ ගැඹුරයි.
(2) මත්ස්‍ය රංචු ගැවසෙන ස්ථානයයි.
(3) යාත්‍රාව පිහිටි ස්ථානයයි.
(4) යාත්‍රාව පිහිටි ස්ථානයේ කාලගුණ තත්ත්වයයි.

24. මත්ස්‍ය සම්පතේ තිරසර බවට වැඩි ම අහිතකර බලපෑමක් එල්ල වන තෙළීමේ ක්‍රමය මින් කුමක් ද?
(1) මරුවැල් පන්නය (2) බිලී පිත්ත (3) පුඩු පන්නය (4) කරමල් දැල

25. පාරම්පරික ධීවර යාත්‍රා අතුරෙන් විශාලත ම යාත්‍රාව මින් කුමක් ද?
(1) ඔරුව (2) මාදැල් පාරුව (3) වල්ලම (4) තෙප්පම

26. ජීවී ඇම් යොදා මත්ස්‍යයින් ආකර්ෂණය කර අල්ලා ගන්නා පන්නය මින් කුමක් ද?
(1) මාදැල (2) පුඩු පන්නය (3) මරුවැල (4) පැස් පන්නය

27. මත්ස්‍ය නිරීක්ෂණ උපකරණයේ (Fish finder) ක්‍රියාකාරිත්වය සඳහා යොදා ගන්නේ,
(1) ධ්වනි තරංග ය. (2) තාප තරංග ය.
(3) රේඩියෝ තරංග ය. (4) විද්‍යුත් චුම්භක තරංග ය.

28. වෙළෙඳපොළේ දී අලුත් මාළුවකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
(1) තද රතු පැහැති ඇස්වලින් යුක්ත වීම ය.
(2) ඇඟිල්ලෙන් එබූ විට ඇතිවන සලකුණ දිගු වේලාවක් රැඳී තිබීම ය.
(3) ඇඟිල්ලෙන් එබූ විට ඇතිවන සලකුණ ඉක්මනින් නැති වී යාම ය.
(4) කරමල ලා රෝස පැහැති වීම ය.

29. ජාඩි නිෂ්පාදනයේ දී බහුලව යොදා ගන්නා මත්ස්‍ය වර්ගය මින් කුමක් ද?
(1) සාලයා (2) හාල් මැස්සා (3) බලයා (4) තිලාපියා

30. ටූනා මසුන් තුළ හිස්ටමීන් ජනනය වීම ඇරඹෙන්නේ,
(1) බැක්ටීරියා ක්‍රියාකාරිත්වය නිසා ය.
(2) එන්සයිම ක්‍රියාකාරිත්වය නිසා ය.
(3) වාතයට නිරාවරණය වීම නිසා ය.
(4) රසායනික ද්‍රව්‍ය එකතු වීම නිසා ය.

31. මත්ස්‍ය අස්වනුවල මුඩු ගඳක් සහ දුර්වර්ණයක් ඇතිවීමට හේතු වන්නේ,
(1) ක්ෂුද්‍රජීවීන් විසින් මාංස පටක වියෝජනය කිරීම ය.
(2) මාංසයේ ඇති මේදය ඔක්සිකරණය වීම ය.
(3) මාංසය සමග ප්‍රතිඔක්සිකාරක ද්‍රව්‍ය ක්‍රියා කිරීම ය.
(4) වාතයට නිරාවරණය වීමේ දී මාංසයේ pH අගය අඩු වීම ය.

[ගතරවැනි පිටුව බලන්න.

32. වෙළෙන්දෙක් අයිස් යොදා මත්ස්‍ය අස්වනු පරිරක්ෂණය කිරීමේ දී යොදාගත් ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.
A – කරමල් හා අතුනුබහන් ඉවත් කර පිරිසිදු ජලයෙන් සෝදා අයිස් තුළ ගබඩා කිරීම
B – මත්ස්‍යයින් සම්පූර්ණයෙන් වැසෙන සේ විශාල කැට අයිස් යොදා ගැනීම
C – මසුන් ගබඩා කරන පෙට්ටි හා රාක්ක ඉතා හොඳින් පිරිසිදු කිරීම
මින් වඩාත් උචිත ක්‍රියාමාර්ග වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) A, B හා C සියල්ල ම ය.

33. ධීවර යාත්‍රා තුළ මසුන් ගබඩා කිරීමේ දී වඩාත් ම සුදුසු වන්නේ මින් කුමන ද්‍රව්‍ය භාවිත කිරීම ද?
(1) කුඩු අයිස් (2) කැට අයිස්
(3) ශීතනය කළ මිරිදිය ජලය (4) ශීතනය කළ මුහුදු ජලය

34. පහත A සිට D දක්වා මත්ස්‍ය වර්ග කිහිපයක නම් සඳහන් කර ඇත.
A – හුලා
B – තිලාපියා
C – කෙලවල්ලා
D – කුම්බලාවා
වැඩි ම මේද ප්‍රතිශතයක් අඩංගු මත්ස්‍ය වර්ග වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) C හා D ය.

35. විවෘත ප්‍රවිශ්‍යයකින් තොරව වරම් ලත් ධීවරයින් සංඛ්‍යාවක් සඳහා පමණක් වෙන් වූ ධීවර කර්මාන්තයක් වන්නේ,
(1) නොගැඹුරු මුහුදේ දැල් පන්න කර්මාන්තයයි.
(2) නොගැඹුරු මුහුදේ මාදැල් පන්න කර්මාන්තයයි.
(3) ගැඹුරු මුහුදේ දැල් පන්න කර්මාන්තයයි.
(4) ගැඹුරු මුහුදේ මරුවැල් පන්න කර්මාන්තයයි.

36. මත්ස්‍යයන්ට වැළඳෙන දිලීර රෝගයක් වන්නේ,
(1) වරල් කුණු වීම ය. (2) සුදු පුල්ලි රෝගය ය.
(3) කොරල ඉලිප්පීම ය. (4) කොඳු ඇට පෙළ ඇද වීම ය.

37. ජලජ ජීව සම්පත් කළමනාකරණය සඳහා රාජ්‍ය නීති හා රෙගුලාසි යොදා ගැනීම 'බලාත්මක කළමනාකරණය' ලෙස හඳුන්වයි. එවැනි කළමනාකරණයක් දක්නට ලැබෙන්නේ,
(1) රැකව කලපු ප්‍රදේශය කළමනාකරණයේ දී ය.
(2) මීගමුව කලපුවේ කට්ටු දැල් ධීවර කර්මාන්තයේ දී ය.
(3) හික්කඩුව කොරල්පර ප්‍රදේශය කළමනාකරණයේ දී ය.
(4) ගිරිතලේ ජලාශයේ මිරිදිය ධීවර කර්මාන්තයේ දී ය.

38. ශ්‍රී ලංකාවේ සහ අවට මුහුදේ සාමුද්‍රික මත්ස්‍ය සම්පත තිරසර කළමනාකරණය සඳහා පාර්ශවකරුවන් විසින් පිහිටුවාගෙන ඇති සංවිධානය මින් කුමක් ද?
(1) යුරෝපා කොමිසම
(2) ඉන්දියන් සාගර ටූනා කොමිසම
(3) බෙංගාල බොක්ක වැඩසටහන
(4) ආසියා-ශාන්තිකර මත්ස්‍ය කොමිසම

39. ධීවර කර්මාන්තය සංවර්ධනයේ දී පෞද්ගලික අංශය වැඩි දායකත්වයක් දක්වන්නේ,
(1) ධීවර වරාය පහසුකම් ඇති කිරීමට ය.
(2) ධීවර සම්පත් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට ය.
(3) අභිජනන මධ්‍යස්ථානවල සිටින මත්ස්‍ය පැටවුන් බෙදා දීමට ය.
(4) මත්ස්‍ය වෙළෙඳාම් කටයුතු කිරීමට ය.

40. රාජ්‍ය අංශය මගින් ක්‍රියාත්මක වන යාත්‍රාංගන පාලනය කරනු ලබන්නේ,
(1) ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) මගිනි.
(2) ලංකා ධීවර සංස්ථාව (CFC) මගිනි.
(3) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) මගිනි.
(4) සීනෝර් පදනම මගිනි.

* *

0002041

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

82 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය	I, II
நீருயிரினவளத் தொழினுட்பவியல்	I, II
Aquatic Bioresources Technology	I, II

ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. (A) ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් කිහිපයක් පහත රූපයේ දැක්වේ.

(i) රූපයේ දැක්වෙන ක්‍රියාකාරකම්වලට අදාළ ජල ප්‍රභවයක් සඳහන් කරන්න.

(ii) (a) රූපයේ දැක්වෙන ධීවර පන්නයක් සඳහන් කරන්න.

(b) රූපයේ දැක්වෙන ධීවර යාත්‍රාව නම් කරන්න.

(iii) මෙම ජල ප්‍රභවය සංරක්ෂණය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(iv) රූපයට අදාළව මත්ස්‍ය පසු අස්වනු හානි සිදුවන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(v) ආහාරයට නුසුදුසු මත්ස්‍ය අස්වනුවලින් ගත හැකි ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

(vi) මෙම ස්ථානය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(B) නුවරඑළිය ප්‍රදේශයේ තරුණයෙක් මිරිදිය මත්ස්‍යයින් භාවිතයෙන් කරවල සැකසීම අත්හදා බැලීමට අදහස් කරන ලදී.

(i) කරවල සැකසීමේ ක්‍රියාවලිය ගැලීම් සටහනකින් දක්වන්න.

(ii) මත්ස්‍යයින් 15 kg ක් යොදාගෙන නිෂ්පාදනය කළ හැකි කරවල ප්‍රමාණය කිලෝග්‍රෑම්වලින් කොපමණ ද?

(iii) ප්‍රදේශයේ දේශගුණය අනුව මත්ස්‍යයින් වියළීමට ඔහුට යොදාගත හැකි ක්‍රමයක් සඳහන් කරන්න.

(iv) ගුණාත්මක කරවල හඳුනාගත හැකි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

[හයවැනි පිටුව බලන්න.

2. පහත රූපයේ දැක්වෙන්නේ ජලජ පරිසර පද්ධතියකි.



(i) (a) A, B හා C ජල ස්තර නම් කරන්න.

(b) A ජල ස්තරයේ ජීවත්වන මසුන්ගේ දේහ හැඩය කුමක් ද?

(ii) (a) රූපයේ දක්වා ඇති ජලජ පරිසර පද්ධතියේ පවතින ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(b) එම ජලජ පරිසර පද්ධතියේ නිෂ්පාදකතාව ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(iii) (a) මෙවැනි ජලජ පරිසර පද්ධතියක දැකිය හැකි, මත්ස්‍යයින් හැර වෙනත් ජීවීන් **හතර දෙනෙක්** සඳහන් කරන්න.

(b) මෙම ජලජ පරිසර පද්ධතියේ වැදගත්කම විස්තර කරන්න.

3. ශිෂ්‍යයකු විසින් A හා B ලෙස නම් කළ මත්ස්‍යයින් දෙදෙනෙකු විච්ඡේදනය කරන ලදී. ඔවුන්ගේ ආහාර ජීර්ණ පද්ධති පිහිටි ආකාරය පහත රූපසටහන් මඟින් දක්වා ඇත.



A මත්ස්‍යයා

B මත්ස්‍යයා

(i) A මත්ස්‍යයාගේ a, b, c හා d කොටස් නම් කරන්න.

(ii) (a) B මත්ස්‍යයාට සාපේක්ෂව A මත්ස්‍යයාගේ ජීරණ පද්ධතිය දිගු වීමට හේතුව සඳහන් කරන්න.

(b) B මත්ස්‍යයා ඇතුළත් පුරුක් තුනක් සහිත ආහාර දාමයක් ඇඳ නම් කරන්න.

(iii) (a) B මත්ස්‍යයාට ලබාදිය හැකි ආහාර වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(b) B මත්ස්‍යයින් ඇති කිරීමේ දී මතුවන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

4. ශ්‍රී ලංකාවේ වෙරළාසන්නව දැකිය හැකි කොරල්පර පරිසර පද්ධතිය ආර්ථික, පාරිසරික මෙන් ම සමාජීය මෙහෙවරක් ඉටු කරයි.

(i) ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කොරල්පර පිහිටි ප්‍රදේශ **තුනක්** නම් කරන්න.

(ii) කොරල්පර පරිසර පද්ධතියක් ආරක්ෂා කරගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න.

(iii) (a) කොරල්පර පරිසර පද්ධතියේ පැවැත්මට බලපාන ස්වභාවික තර්ජන **දෙකක්** සඳහන් කරන්න.

(b) කොරල්පර පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න.

5. රූපයේ දැක්වෙන්නේ මත්ස්‍ය වෙළෙඳසැලක මසුන් ප්‍රදර්ශනය කර ඇති ආකාරයයි.



(i) මෙහි මසුන් ප්‍රදර්ශනය කිරීමේ දී මසුන්ගේ ගුණාත්මකභාවය රැක ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(ii) (a) මෙහිදී වෙළෙඳසැල් හිමියා විසින් අනුගමනය කර ඇති **වැරදි** ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(b) එම වැරදි ක්‍රියාමාර්ග මත්ස්‍ය අස්වනුවල ගුණාත්මකබව පිරිහීමට බලපාන අයුරු විස්තර කරන්න.

(c) ඉහත (ii) (a) හි සඳහන් කළ වැරදි ක්‍රියාමාර්ග දෙක නිවැරදි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න.

(iii) වෙළෙඳපොළේ මත්ස්‍ය අස්වනුවල ගුණාත්මකබව රැක ගැනීමෙන් පාරිභෝගිකයාට ඇති වාසි විස්තර කරන්න.

6. කලපුවක් ආශ්‍රිතව වෙසෙන තරුණයෙක් ස්වයං රැකියාවක් ලෙස ජලජ ජීව වගාවේ නියැලීමට අදහස් කරන ලදී.

(i) (a) එම වගාව සඳහා ඔහුට තෝරාගත හැකි ජලජ ජීවීන් වර්ග **හතරක්** සඳහන් කරන්න.

(b) එම ජලජ ජීවීන් වගා කිරීමට යොදාගත හැකි වගා ව්‍යුහ **දෙකක්** සඳහන් කරන්න.

(c) වගාවට අවශ්‍ය කුඩා පැටවුන් ලබාගත හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(ii) (a) ශ්‍රී ලංකාවේ ජලජ ජීව වගාව සඳහා යොදා ගැනෙන වගා ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(b) ජලජ ජීව වගාවේ දී ලාභය උපරිම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න.

(iii) (a) ජලජ ජීව වගාව නිසා කලපු පරිසර පද්ධතියට හානි සිදුවන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(b) කලපු පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න.

7. මෑත කාලයේ දී ආහාරමය ජලජ ශාක වගාව පිළිබඳව ජනතාවගේ උනන්දුව වැඩි වී ඇත.

(i) ආහාරමය ජලජ ශාක වගාවේ වැදගත්කම සඳහන් කරන්න.

(ii) ආහාරමය ජලජ ශාක වගා ක්‍රම **දෙකක්** නම් කර, ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න.

(iii) ආහාරමය ජලජ ශාක වගාව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත කිරීමට ඇති විභවය විස්තර කරන්න.

* * *